# 2 නව ගිවිසුමේ පොත් වර්ගීකරණය

**නව ගිවිසුම**

- **ශුභාරංචි හා අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත (5)**
  1. මතෙව් ශුභාරංචිය
  2. මාක් ශුභාරංචිය
  3. ලූක් ශුභාරංචිය
  4. ජොහන් ශුභාරංචිය
  5. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත
- **හසුන් (21)**
  - **ශු. පාවුලු තුමාගේ ලිපි (13)**
    1. රෝම
    2. 1 කොරින්ති
    3. 2 කොරින්ති
    4. ගලාති
    5. එපීස
    6. පිලිප්පි
    7. කොලොස්සි
    8. 1 තෙසලෝනික
    9. 2 තෙසලෝනික
    10. 1 තිමති
    11. 2 තිමති
    12. තීතස්
    13. පිලමොන්
  - **වෙනත් ලිපි (8)**
    1. හෙබ්‍රෙව්
    2. ජාකොබ්
    3. 1 පේදුරු
    4. 2 පේදුරු
    5. 1 ජොහන්
    6. 2 ජොහන්
    7. 3 ජොහන්
    8. ජුද්
- **එළිදරව් සාහිත්‍යය (1)**
  - 1 එළිදරව් පොත

දහම් පාසලේ ප්‍රධාන දහම් ගුරුතුමිය වෙත දහවන ශ්‍රේණියේ ළමුන්ගෙන් අළුත් යෝජනාවක් ඉදිරිපත් විණි. ඒ දහම් පාසලේ අකුරු කියවීමට හා ලිවීමට අපහසු ළමුන් එකතු කර ඔවුන්ට ඉගැන්වීම යි. ඉහත යෝජනාව මීසම් සේවක පියතුමාගේ අවසරය ඇති ව ක්‍රියාත්මක වූ අතර දහවන ශ්‍රේණියේ සිසුන් ඉගැන්වීමේ ක්‍රියාවලියෙහි උනන්දුවෙන් නිරත වූහ. ළමුන්ගේ උනන්දුව හා උත්සාහය ගැන පැහැදුණු මීසම්වාසීන් ද ඔවුන්ට ආහාරපාන, ලිපි ද්‍රව්‍ය ආදියෙන් සහයෝගය දැක්වූහ.

මේ පිළිබඳ ආරංචිය ලැබූ ගමේ අනෙකුත් දරුවන් ද ආගම් හා ජාති භේදයකින් තොර ව වැඩසටහනට සහභාගි වූ අතර ළමුන්ගේ මේ ප්‍රයත්නයට ප්‍රසාදය පළ කළ පියතුමා හා මීසම්වාසීහු ඔවුන් ව තව තවත් ධෛර්යවත් කළහ.

මේ ආකාරයට කටයුතු කිරීමේ දී අපෝස්තලික සභාව අපට අනගි ආදර්ශයක් සපයන අතර ඒ පිළිබඳ ව අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතේ සඳහන් වේ.

## අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත

අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි කතුවරයා ලූක් ශුභාරංචිය ලියූ ශු. ලූක් තුමා ය. ක්‍රියා පොත, ලූක් ශුභාරංචියේ දෙවන කාණ්ඩය ලෙස සලකනු ලැබේ. මෙම පොත් දෙක ම පිළිගන්වා ඇත්තේ, "තියෝපිලස්" නමැති උසස් නිලයක් දරූ තැනැත්තකුට ය (ලූක් 1:1-4, ක්‍රියා 1:1). එම නමෙහි අර්ථය වන්නේ, "දෙවියන් වහන්සේගේ මිත්‍රයා" යන්න යි.

ශු. ලූක් තුමා ඉතිහාසඥයෙකි; චිත්‍ර ශිල්පියෙකි; වෛද්‍යවරයෙකි. ශු. පාවුලු තුමාගේ දෙවන හා තෙවන ධර්මදූත චාරිකාවලට එතුමා සම්බන්ධ වී ඇත.

අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත රචනා වී ඇත්තේ, ග්‍රීසියේ "අක්කායා" නම් ස්ථානයේ ක්‍රි.ව. 80-90 අතර කාලයේ විය හැකි ය.

ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පරිපූර්ණ වූ අපෝස්තුලුවරු ජෙරුසලමෙන් හා ජුදයාවෙන් සුබ අස්න දේශනා කිරීමට පටන් ගෙන සමාරියන් හා අන්‍ය ජාතීන් වෙතටත් අවසානයේ පොළොවේ සීමාන්තයන් දක්වාත් සුබ අස්න දේශනා කිරීම මෙහි අන්තර්ගත වේ (ක්‍රියා 1:8). එම නිසා දෙවියන් වහන්සේගේ මිතුරකු වී, ජේසුස් වහන්සේ පිළිබඳ සුබාරංචිය අන් අය වෙත ගෙන යාමට උත්සාහ කළ යුතු ය.

### අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙහි සැකැස්ම

i. ධර්මදූත සේවයට සූදානම (ක්‍රියා 1)
ii. ජෙරුසලමෙහි සාක්ෂි දරීම (ක්‍රියා 2-7)
iii. ජුදයේ හා සමාරියේ සාක්ෂි දරීම (ක්‍රියා 8-12)
iv. ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්මදූත සේවය (ක්‍රියා 13-28)

## ක්‍රියාකාරකම

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| කො | රි | න් | ති | අ | හෙ | බ්‍රෙ | වි | ල | එ |
| ති | මා | රා | ජො | කො | ලො | ස් | සි | පී | ක |
| ලූ | ක් | ටු | හ | ප | ග | තෙ | ස | ලෝ | නි |
| ඩූ | නී | රෝ | න් | වි | ට | පි | ල | මො | න් |
| එ | ජ | ම | තෙ | වි | තී | ලු | ලි | වා | හේ |
| ළි | පේ | රේ | ග | කු | ත | ජෝ | තු | ප් | ත |
| ද | දු | අ | ක් | ලා | ස් | හ | ඨ | ද | පි |
| ර | රු | සේ | ජා | මා | ති | න් | න | ජු | ත |
| වි | ල | කො | ව | රෝ | ම | ලි | ග | ද් | යා |
| ව | බි | ඉ | ප | පේ | ති | පි | ජ | ක්‍රි | ඩ |

1. ඉහත සඳහන් වගුවෙහි නව ගිවිසුමෙහි පොත් සැඟ ව ඇත. ඒවා තෝරා ලකුණු කරන්න.
2. මුල් කිතුනු සභාවේ ලක්ෂණ **හතර** ලියන්න.
3. දෙවියන් වහන්සේගේ මිතුරකු වීමට ඔබට කළ හැකි කාර්ය **හතරක්** ලියන්න.
4. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත පිළිබඳ නිර්මාණයක් කර, ළමා ප්‍රදීපයට යවන්න.

### *ජීවිතය සඳහා*

- *නිවස තුළ දිනපතා යාච්ඤාවේ දී අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොතෙන් කොටසක් කියවන්න.*
- *මුල් කිතුනු සංඝය තුළ වූ ගුණාංග ඔබේ නිවස තුළ පුහුණුවීමට මූලිකත්වය ගන්න.*
- *ඔබේ පන්ති කාමරය තුළ බෙදා හදා ගෙන සහයෝගයෙන් වැඩ කරන්න.*
- *ඔබගේ ජීවිත ආදර්ශයෙන් සුබ අස්න පතල කරන ධර්මදූතයකු වන්න.*